1963

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2016
Year End Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 06 | විෂයය / பாடம் / Subject: ඉතිහාසය | පත්‍රය / வினாத்தாள் / Paper: I,II | කාලය / காலம் / Time: පැය 02 |

නම :- ........................................................................................ විභාග අංකය :- ..........................

I කොටස

සැලකිය යුතුයි:

* I කොටසේ ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.
* අංක 1 -20 දක්වා ප්‍රශ්න සඳහා දී ඇති පිළිතුරු අතරින් වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

(01) ඉතිහාසය ඉගෙනගැනීමට උපකාරී වන මූලාශ්‍රය අතරින් සාහිත්‍යමය මූලාශ්‍රය වර්ගයට අයත් වන්නේ මින් කුමක් ද?
(1) වංස කතා (2) සෙල්ලිපි (3) නටබුන් (4) පැරණි භාණ්ඩ

(02) දීපවංසය රචනා වූ කාලය ලෙස සැලකෙන්නේ,
(1) ක්‍රි.ව.හතරවන සියවස ය. (2) ක්‍රි.ව.පස්වන සියවස ය.
(3) ක්‍රි.ව.හත්වන සියවස ය. (4) ක්‍රි.ව.දොළොස්වන සියවස ය.

(03) 'හැකි මිනිසා' යන අරුතින් හඳුන්වනු ලබන මානව වර්ගය වන්නේ,
(1) ඔස්ට්‍රලෝපිතිකස් ය. (2) හෝමෝ හැබිලිස් ය.
(3) හෝමෝ ඉරෙක්ටස් ය. (4) හෝමෝ සාපියන් ය.

(04) මානව පරිණාමයේ දී මුල්කාලයේ සිටි වානරයින්ට කළ නොහැකි දේ, මානවයින්ට කළහැකි වූයේ කුමන හේතුව නිසා ද?
(1) ගින්දර භාවිතා කිරීම සිදුකළ නිසා.
(2) සමූහ වශයෙන් ජීවත් වීම නිසා.
(3) දේශගුණ විපර්යාසයන්ට ඔරොත්තු දීම නිසා.
(4) පාද දෙකෙන් ඇවිද යාමට හැකිවීම නිසා.

(05) මිනිසා පළමුවරට ගින්දර භාවිතාකිරීම පිළිබඳ සාක්ෂි සොයාගෙන ඇත්තේ,
(1) ඊශ්‍රායලයෙන්ය. (2) චීනයෙන්ය. (3) ඉන්දියාවෙන්ය. (4) අප්‍රිකාවෙන්ය.

(06)
- විශාල සතුන්ගේ ඇටකටු භාවිතා කර නිවාස ඉදිකිරීම.
- එළවළු වර්ග පිස ආහාරයට ගැනීම.
- හොඳ දඩයක්කරුවෙකු වීම.

ඉහත හැකියාවලින් පරිපූර්ණ වූ මානව වර්ගය,
(1) හෝමෝ ඉරෙක්ටස් ය. (2) හෝමෝ නියැන්ඩතාලෙන්සිස් ය.
(3) ඔස්ට්‍රලෝපිතිකස් ය. (4) හෝමෝ හැබිලිස් ය.

(07) ගොවිතැන් කිරීමට පුරුදු වූ අපේ රටේ පැරණිතම ජනතාව ජීවත්වූයේ මින් කවර ප්‍රදේශයකද?
(1) කඳුකර ප්‍රදේශවල ය. (2) වෙරළබඩ ප්‍රදේශවල ය.
(3) තෙත් කලාපීය ප්‍රදේශවල ය. (4) වියළි කලාපීය ප්‍රදේශවල ය.

(08) තිරිඟු මුල්වරට වගාකර ඇත්තේ,
(1) මෙසපොතේමියාවේ ය. (2) නයිල් ගඟ අසබඩ ය.
(3) මෙක්සිකෝ ප්‍රදේශයේ ය. (4) මධ්‍යධරණී ප්‍රදේශයේ ය.

(09) පළමුවරට රබර් බෝලයක් තැනීමේ ගෞරවය හිමිවන්නේ මින් කවර ශිෂ්ටාචාරයට ද?
(1) ඊජිප්තු ශිෂ්ටාචාරය (2) චීන ශිෂ්ටාචාරය
(3) මායා ශිෂ්ටාචාරය (4) ඉන්දුනිම්න ශිෂ්ටාචාරය

(10) විජය කුමරු ඇතුළු පිරිස ගොඩබසින ලද ප්‍රදේශය හැඳින්වෙන්නේ කුමන නමින්ද?
(1) දඹකොළපටුන (2) සිරිසවත්ථුපුර (3) ලංකාපුර (4) තම්බපණ්ණි

(11) පණ්ඩුකාභය කුමරුට ළමාකාලයේ ශිල්ප ශාස්ත්‍ර ඉගැන් වූ ගුරුවරයා කවුරුන් ද?
(1) පණ්ඩුල ය. (2) අභය ය. (3) චිත්තරාජ ය. (4) උපතිස්ස ය.

(12) රුවන්වැලිසෑය ඓතිහාසික මූලාශ්‍රය වල හඳුන්වා ඇත්තේ කුමන නමකින්ද?
(1) ස්වර්ණමාලී (2) මහාථූප (3) සෑගිරිය යි. (4) රත්නමාලී

(13) අසල තිබූ අඹගසක් මුල්කරගෙන අසනු ලැබූ ප්‍රශ්න වලට බුද්ධිමත් ලෙස පිළිතුරු ලබාදුන් රජතුමා මින් කවුරුන් ද?
(1) පණ්ඩුකාභය රජු ය. (2) මුටසීව රජු ය.
(3) දේවානම්පියතිස්ස රජු ය. (4) දුටුගැමුණු රජු ය.

(14)
- ◆ ධාන්‍යාකාර හැඩයෙන් ඉදිකිරීම
- ◆ වටදාගෙයක් නිර්මාණය කිරීම
- ◆ දකුණු අකු ධාතුව නිදන් කිරීම

ඉහත කරුණුවලට අදාල වන ස්තූපය වන්නේ,
(1) මිරිසවැටිය ය. (2) රුවන්වැලි සෑය ය.
(3) අභයගිරිය ය. (4) ථූපාරාමය ය.

(15) අනුරාධපුර යුගයේ දී වෙළඳ කටයුතුවලින් සරු ආදායමක් ලැබුණු වරාය වූයේ,
(1) මාතොට (2) දඹකොළ පටුන (3) ගෝකණ්ණතිත්ථ (4) ලංකා පටුන

(16) දුටුගැමුණු රජතුමා රජවීමට පෙර අනුරාධපුරය පාලනය කරන ලද්දේ පහත සඳහන් අයගෙන් කවුරුන් ද?
(1) කාවන්තිස්ස රජු ය. (2) වසභ රජු ය.
(3) අසේල රජු ය. (4) එළාර රජු ය.

(17) සෙල්ලිපිවල 'පිත මහරජ' යන නාමයෙන් හඳුන්වා ඇත්තේ,
(1) වසභ රජු ය. (2) වළගම්බා රජු ය.
(3) බල්ලාටනාග රජු ය. (4) දේවානම්පියතිස්ස රජු ය.

(18) දුටුගැමුණු කුමරු හා එළාර රජු මුණගැසී සටන්කළ ස්ථානය ලෙස සැලකෙන්නේ,
(1) අනුරාධපුරය (2) පොළොන්නරුව (3) විජිතපුරය (4) ත්‍රිකුණාමලය

(19) වළගම්බා රාජ්‍ය කාලයට අයත් නොවන සිදුවීම දක්වෙන පිළිතුර තෝරන්න.
(1) තිස්ස බ්‍රාහ්මණයාගේ කැරැල්ලට මුහුණ දීම
(2) ජේතවන දාගැබ ඉදිකරවීම
(3) දකුණු ඉන්දීය ආක්‍රමණයකට මුහුණ දීම
(4) ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කරවීම

(20) මහසෙන් රජු 'මින්නේරි දෙවියන්' නමින් ජනතාවගේ වන්දනාමානයට ලක් වී ඇත්තේ කුමන හේතුව නිසාද?
(1) වෙහෙර විහාර ඉදිකරමින් බුදු සසුනේ සංවර්ධනයට කටයුතු කළ නිසා ය.
(2) විවිධ ආක්‍රමණවලින් රට බේරාගත් නිසාය.
(3) විවිධ දෙවිවරු වෙනුවෙන් දේවාල ඉදිකළ නිසා ය
(4) මහවැව් ඉදිකොට රටවැසියාගේ යහපතට කටයුතු කළ නිසාය.

(ලකුණු 2 x 20 = 40)

## II කොටස

* පළමු ප්‍රශ්නය අනිවාර්යය වේ.

* අනෙකුත් ප්‍රශ්න අතුරින් කැමති ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.

* පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න ගණන පහකි.

---

(01) A හා B වශයෙන් දක්වා ඇති පින්තූර ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A



(i) මෙම පින්තූරයෙන් දක්වෙන්නේ කුමක් දැයි ලියා දක්වන්න.
(ii) මෙය කුමන කාර්යයක් සඳහා භාවිතා කර තිබේද?
(iii) මෙම නිර්මාණය කුමන ශිෂ්ටාචාරයට අයත් වේද?
(iv) මෙම නිර්මාණය තුළින් හෙළිකරගත හැකි සාක්ෂියක් ලියන්න.
(ලකුණු 08)

B



(i) මෙම පින්තූරය කුමක් ද?
(ii) මේවායේ ප්‍රවාහනය කළ එක් දෙයක් නම් කරන්න.
(iii) මෙය කුමන ශිෂ්ටාචාරයට අයත්වේද?
(iv) මෙම ශිෂ්ටාචාරයේ විසූ දක්ෂ වෙළෙන්දන් හැඳින්වූයේ කුමන නමින්ද? (ලකුණු 08)

(02) (i) පුරා විද්‍යාත්මක මූලාශ්‍රය දෙකක් නම් කරන්න. (ලකුණු 02)
(ii) ක්‍රිස්තුපූර්ව හා ක්‍රිස්තුවර්ෂ අතර වෙනස කෙටියෙන් දක්වන්න. (ලකුණු 04)
(iii) ඔබේ පාසලේ ඉතිහාසය පිළිබඳ වගන්ති පහක් ලියා දක්වන්න. (ලකුණු 05)

(03) (i) A - පෘථිවිය සෑදීම පිළිබඳව පවතින පොදු විශ්වාසය කුමක් ද?
B ලෝකයේ මුලින්ම ජීවීන් බිහිවූයේ කවර පරිසරයකද? (ලකුණු 02)
(ii) විවිධ දේහ ලක්ෂණ සහිතව ලෝකයේ ව්‍යාප්ත වූ හෝමෝසාපියන්වරු වර්ග දෙකක් නම් කරන්න. (ලකුණු 04)
(iii) මිනිසා ගොවිතැනට යොමුවීමත් සමග ඔවුන්ට අත් වූ වාසි පිළිබඳ වගන්ති පහක් ලියා දක්වන්න.
(ලකුණු 05)

(04) (i) පහත දක්වෙන ශිෂ්ටාචාර ගංගා නිම්න පිළිවෙලින් නම් කරන්න.
A - ඊජිප්තු ශිෂ්ටාචාරය
B - මෙසපොතේමියානු ශිෂ්ටාචාරය (ලකුණු 02)
(ii) පහත සඳහන් තොරතුරු වලට අදාළ ශිෂ්ටාචාර පිළිවෙලින් නම් කරන්න.
A - වෙඩිබෙහෙත් නිපදවීම -
B - ලෝකයේ පැරණිම නීතිපොත -
C - සත්ත්ව සංකේත සහිත මැටි මුද්‍රා -
D - මමීකරණ ක්‍රමය - (ලකුණු 04)
(iii) ඊජිප්තු ශිෂ්ටාචාරයෙන් ලොවට ලැබුණු දායාද පිළිබඳ කෙටි විස්තරයක් ලියන්න. (ලකුණු 05)

(05) (i) අපේ ආදී මුතුන් මිත්තන් ජීවත් වූ ගල්ගුහා පිහිටි පිහිටි ස්ථාන දෙකක් නම් කරන්න. (ලකුණු 02)
(ii) අපේ ආදී මුතුන්මිත්තෝ ආහාරයට ගත් සත්ව ආහාර සහ ශාකමය ආහාර දෙකක් ලියා දක්වන්න. (ලකුණු 04)



169

(iii) මෙරට ගල්යුගයේ ජීවත් වූ ජනතාව තමන්ගේ මියගිය නෑදෑයින් වෙනුවෙන් සිදුකළ අවමංගල චාරිත්‍රයන් පිළිබඳ කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

(06) (i) ධාතුසේන රජතුමාගේ පුතුන් දෙදෙනාගේ නම් ලියා දක්වන්න. (ලකුණු 02)

(ii) ධාතුසේන රජතුමා බුදු දහමේ දියුණුව උදෙසා කළ කාර්යයන් දෙකක් සඳහන් කරන්න. (ලකුණු 04)

(iii) වාරි කර්මාන්තය නගා සිටුවීම උදෙසා ධාතුසේන රජතුමා ඉටුකළ උදාර සේවාව කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

(07) (i) A වසභ රජතුමා අයත් රාජවංසය කුමක් ද?

B වසභ රජතුමාගේ කාලයේ ලියැවුණු රන්පත හඳුන්වන්නේ කුමන නමින්ද? (ලකුණු 02)

(ii) අනුරාධපුර නගරයේ ආරක්ෂාව හා අලංකාරය උදෙසා වසභ රජතුමා ඉටුකළ කාර්යයන් දෙකක් ලියා දක්වන්න. (ලකුණු 04)

(iii) වසභ රජතුමා විසින් කරවන ලද වැව් හා ඇළමාර්ග පිළිබඳව කෙටි විස්තරයක් ලියන්න. (ලකුණු 05)

e තක්සලාව
The National e-learning Portal for The General Education